# 1 මංගල ගමන

කුමාරතුංග මුනිදාස මහතා සිංහල භාෂාවට හා සාහිත්‍යයට මහත් සේවාවක් කළ කීර්තිමත් පඬිවරයෙකි. ළමා කතා හා කවි ගී රචනා කිරීමෙහිලා අපූර්ව කුසලතාවක් පළ කළ එතුමා අතින් ලියැවුණු මඟුල් කෑම, හත්පණ, හීන්සැරය වැනි කතා ළමයින් අතර මෙන් ම වැඩිහිටියන් අතර ද ඉතා ජනප්‍රිය ඒවා විය.

*මෙම පාඩමට ඇතුළත් වන්නේ ''මඟුල් කෑම'' කෘතියෙන් උපුටා ගත් කොටසකි. සතුන් දෙකොටසක් අතර ඇති වන්නට ගිය විවාහයක් සම්බන්ධ කර ගෙන මෙම කතාව ගොතා ඇත. සත්ත්ව දෙවර්ගය නම් නරියන් සහ කුකුළන් ය. එම සත්ත්ව දෙවර්ගයේ චරිතවලට මිනිස්ලොව නම් ගම් ආරූඪ කර ඇත.*

නියම දින හීන් හාමි නෑයන් කිහිප දෙනෙකුන් සමඟ මහ මල්හාමිගේ නිවසට පැමිණියේ ය. ගෙහිමියෝ ආදරයෙන් අමුත්තන් පිළිගත්හ. වේලාවට සුදුසු සංග්‍රහ විඳ අමුත්තන් හුන් කල්හි, කපටි හාමි මහ මල්හාමිගේ කනට කොඳුරා යම් කිසිවක් කීයේ ය. මහ මල්හාමි හිස සලා ගෙට ගොස්, හාමිනේට යම් කිසිවක් කියා අවුත් හිඳ ගත්තේ ය. සියල්ලෝ ම නිශ්ශබ්ද වූහ.

මඳ වේලාවකට පසු මහ මල්හාමිගේ දුව පොඩි හාමිනේ මවත් සමඟ පෙනුණා ය.ඈ ආවා නො වේ. මවගේ උත්සාහයෙන් ම එවුණා ය. අමුත්තන්ට පෙනෙන්නට වූ කල පොඩි හාමිනේ දෑස නොදල්වා මුහුණ බිමට හරවා ගෙන යන්තමින් ඉදිරියට ආවා ය.



මව අමුත්තන් හඳුන්වා දුන්නී ය. දුව ඒ එක එක අමුත්තාට ආචාර පවත්වාමවගේ නියමය පරිදි පසෙකින් හිඳ ගත්තා ය. "අපටත් මුල දී ලජ්ජා තමා" යි විහිළු හාමි කීයේ ය. එයින් මහ හිනාවක් ඇති විය. පොඩි හාමිනේ ද හිනා එන බව හඟවන්නට උත්සාහ කළා ය.

මඳ වේලාවකට පසු "අපට කටයුතු බොහොමයි" යනු කියමින් මහ මල්හාමිනේ නැගී සිටියා ය. දුව නැගිට මව පසු කොට ගෙන මුවාවකට වන්නී ය. අමුත්තෝ ද නැගී මඳක් ඈතට ගොස් රහස් කියන්නට වූහ. මහ මල්හාමි නෑයන් සමග ඉදිරියට තිබුණු කටයුතු සම්පූර්ණ කිරීමෙහි යෙදුණේ ය.

"යස කෙඳිරියක් නොවෙ යැ? කුමක් වුණා ද ළමයා?" මෙසේ මව නොයෙක් විට කී නමුත් පොඩි හාමිනේගේ කෙඳිරිය නොනැවතුණේ ය."මට බයයි. අනේ අම්මේ, මට නම් බැහැ" යි ද කීවා ය.

"කුමට ද ළමයා බය?"

"බය ! අර ඇසේ රළුව දැක්කා ම, අර කටේ දිග දැක්කා ම, අර දතේ උල දැක්කා ම, අම්මාගේ හිතට බය නැද්ද?"

"බොරු නොදොඩා නිකම් ඉන්න ළමයා. මට ඇති බයෙක් නෑ. හොඳ ළමයින් මවුපියන්ගේ කීමට කීකරු වෙනවා."

ඒ කුමක් කීවත් පොඩි හාමිනේගේ කෙඳිරිය නො නවතී. මහ මල්හාමි ද පැමිණ දුවට අවවාද කරන්නට වූයේ ය. "නුපුරුදු කෙනකුට බය සිතීම ගෑනු ගතිය තමා. අපි ඔබට අහිතක් කරමු ද? මේ සම්බන්ධයෙන් අප සියල්ලන්හට ම වන්නේ යහපතෙකි. ඔබ උපන් කාලයේ ම අපට දැනුණා, මේ කුකුළාගමුවේ කිසිවකුට නොගිය තරම් හොඳ කලක් ඔබට යන බව. හැබැයි, සැප ලැබුණා ම සැමියා නිසා ආඩම්බර වී අප මතක නැති කරන්නට එපා !"

පියාගේ වචනයෙන් පොඩි හාමිනේගේ සිත මඳක් පිපුණේ ය. එහෙත් ඇයට පෙනෙන්නේ අර ඇස ම ය. අර කට ම ය. අර දත ම ය. එහෙයින් කෙඳිරිය සම්පූර්ණයෙන් සුව නොවී ය. නැන්දා ද අවුත් අවවාද කළා ය. මාමා අවුත් විහිළු කළේ ය. "මේ හොර, මැට රැවැටුණා ද? මෑ මීට හොඳට ම කැමැතියි හොරට අකැමැති බවත් පෙන්වනවා. ඉතින් ඔය බොරුවට නොරැවටී අපේ කටයුතු කරමු." මෙයින් එතැන ඇති වූ බොහෝ අමාරුකම් නැති වී ගියේ ය. සියල්ලන්ගේ කරදරයෙන් මෙන් "ඔව්" යන්නෙක් ද, කැමැති ද යන ප්‍රශ්නයට උත්තර වශයෙන් පොඩි හාමිනේගේ කටින් නිකුත් විය.

දෙපක්ෂයේ අය නැවතත් එක්තැන් වූහ. "අපේ ළමයා නම් කැමැතියි" යනුවෙන් විහිළු හාමි දෙඩුම පටන් ගත්තේ ය. අපේ ළමයා අකැමැති වේ ද?" යි මහ මල්හාමි කියා හිස ඔසොවා බැලී ය. සියල්ලෝම ප්‍රීතිය ප්‍රකාශ කළෝ ය. විහිළු හාමි නැගී සිට, ප්‍රස්තාවට සුදුසු දේශනාවක් කළේ ය. ඉක්බිති භෝජන සංග්‍රහය විය.

නැවත ද වරක් පොඩි හාමිනේ අමුත්තන් ඉදිරියට ආවා ය. හීන් හාමි නැගී සිට තම අතෙහි වූ මල්දමක් පොඩි හාමිනේගේ ගෙල වටා දැමී ය. කැරැපොත්තන් පොදියක් ද දුන්නේ ය. පොඩි හාමිනේ ද මවගේ නියමය පරිදි කුකුළු පියාපතක් හීන් හාමිගේ වලිගෙහි පැළැන්දුවා ය. ඉක්බිති අමුත්තෝ මහ මල්හාමි ආදි පිරිසට ආචාර දක්වා අවසර ගෙන නික්මුණාහ.

එද හිවලාවල ඉතා කලබල සහිත ය. කෑමක් බීමක් ගැන සිතන්නෙක් නොවීය. "බලාගෙනයි, ඉක්මන් වෙන්නට එපා." යි තරුණ හිවලුනට වැඩි හිටියෝ අවවාද කෙරෙති. "කවුරු දනිද්ද? කිමෙක් වේ ද? යි කියමින් ඇතැමෙක් සිතේ සැකය පහළ කෙරෙති. "ඔව් ඔව්, තව ම ලැබුණා යැ ? කොයි සැටි වුණත් හිස පහත් කොට ගැනීමයි. හොඳ" යනුවෙන් ඇතැමෙක් මතය අනුමත කෙරෙති.

ඇතැම් තරුණ හිවල්ලු සන්සුන් බව නොදත්හ. "මට හොඳ තර දෙන්නෙක්" යි එකෙක් කියයි. "වෙන ද මෙන් මගේ දේ උදුරා ගන්නට නො එනු" යි මඳක් දුබල වූවෙක් පවසයි. අද ඔබගේ දේ අපට ඕනැ නෑ"යි අනෙකෙක් දුබලයා සනසයි. සියල්ලෝ ම සිනාසෙති. තලු ගසති. තොල ලෙවති. "කෑම කෙළවර නම් පැන් බොනු"යි එකෙක් විහිළු කෙරෙයි.

නුවණ හාමිගේ මුහුණ එද ප්‍රීතියෙන් පිපුණේ ය. දෑස බැබළුණේ ය. විහිළු හාමි කපටි හාමි ආදි වැඩිහිටි කිහිප දෙනෙක් ද එහි වූහ. නුවණහාමි විහිළු හාමි දෙස රහස් බැල්මක් හෙළී ය. මෙසේ ද කී ය.

"ඔබ අද මඟුල් කෑම කනවා යැ?"

"ඇයි නැත්තේ? යි විහිළු හාමි පුදුම වූවකු මෙන් ඇසී ය.

"කනවා නම්, එදා මට විහිළු කෙළේ?"

"ඉඳ හිටලා විහිළුවකුත් නැති නම් කවර අගයෙක් ද?" මෙහි දී කපටි හාමි ද දෙඩුමට වැටුණේ ය.

"හැ, හැ, හැ, ටිකක් බලා ගෙනයි. ගොවිහාමිත් එහි, බලුහාමිත් එහි. පුතාට ගිය කල මතක නැද්ද?"

නුවණ හාමි ඇස ඔරවා දෙඩී ය. "පුතාට ගිය කල? ඒ එද අපට එවැනි කලක් ගියොත් මගේ නමේ මුලට අකුරක් එකතු කරන්නට කීවා නොවේ යැ?"

"එබඳු කලක් ගියාට පසු අකුරු එකතු කළායින් ඇති පලය කිම?"

"අනේ කපටි හාමි, කුකුළාගමුවට කිහිප වරක් ම ගොසිනුත් අපට කළ සැලකිලි දකත්, තවමත් මේ තරම් සැක ද? සැක නම් මෙහි නවතින්න. අප යනවා."

"නෑ උදහස් වෙන්නට මා කීවා නොවෙයි. කුමක් වුවත් පරෙස්සම් සහිත වීම ඔබගේ නමට හොබී."

කපටි හාමිගෙන් ඒ පිළිබඳ දෙඩුම කෙළවර විය. කවුරුත් ගමනට සැරසෙන්නට වූහ. මනමාලයාගේ සැරසිල්ලට බොහෝ වේලා ගත විය. ඔහුට කිහිප දෙනෙක් උපකාර කළහ. හේ මනා ලෙස සැරසී, අසල වූ ගල් කෙමක දියෙහි තමාගේ පිළිබිඹුව බලා හිස කෙළින් කොට ගෙන සෙසු තරුණ සිවලුන් අතරෙහි ඔබමොබ යන්නට විය. මනමාලයා දෙස බැලූ ඇතැමෙක් කර බා ගත්හ. ඇතැමෙක් ඉඟි මරා, යටි තොල දික් කොට, අසල සිටියවුන් දෙස බැලූහ. ඇතැමෙක් ඔවුනොවුන් හා රහස් කියන්නට වූහ.

"දැන් හරියට ම මනමාලයා වාගෙයි " යනුවෙන් එකකුගේ මුවින් පිට විය. "නැත්නම්?" යි කියමින් මනමාලයා ඒ දෙසට හැරී සිනාසුණේ ය."මනමාලිත් කැන්දා ගෙන අද එන කල දෑසින් කෙසේ බලන්නට ද ?" යි එකෙක් ඇද ඇද කී ය. මීට කවුරුත් සිනාසුණහ. හැබෑට ම මනමාලිය කටින් ද ගෙන එන්නේ' යි එකකු ඇසූ කල මනමාලයා  උදහස් වුණේ ය. "නෑ. අපි මනමාලයා කුකුළාගමුවේ නවත්වා එමු"යි එකකු කී බසට, මනමාලයා ගැස්සී සිටියේ ය. "බලාගෙනයි, වැඩි විහිළු හොඳ නෑ" යවයි, අසලින් ගිය නුවණ හාමි කී බසින්, තරුණ පෙළ විසිර ගියෝ ය.

ගමන ආරම්භ විය. පණුවන් කදෙක් ද, කැරපොත්තන් කදෙක් ද පළමු කොට පිටත් විය. බෙර වයන, නළා පිඹින, නටන පිරිසක් ඊ ළඟට නික්මුණාහ. වීණා වයන, සින්දු කියන කිහිප දෙනෙක් තුන් වැනි ව ගියහ. ඉක්බිති පැමිණියේ මනමාලයාය. පෙළ ගැසුණ ඔහුගේ  නෑදෑ පිරිස ඔහු පස්සෙන් වැටුණාහ. ඉතා මහලු වූවන් ද කුඩා දරුවන් ද හැර ඉතිරි සිවලුන්ගෙන් එද හිවලාවල නැවතුණු එකෙකුත් නැත.

## ක්‍රියාකාරකම්

1. පාඩම ශබ්ද නගා කියවන්න.
2. පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. හීන් හාමි හා නෑයන් පැමිණියේ කාගේ නිවසට ද?
   ii. දකින විටත් සිතෙන විටත් පොඩි හාමිනේ බිය වූයේ මොනවාට ද?
   iii. හීන් හාමි පොඩිහාමිගේ ගෙල වටා දැම්මේ කුමක් ද?
   iv. ඇතැම් තරුණ හිවලුන් විහිළුතහළු වශයෙන් කීවේ මොනවා ද?
   v. මනමාලිය කැන්ද ගෙන ඒමට යද්දී රැගෙන ගිය තෑගි බෝග මොනවා ද?
3. මෙම පාඩමේ ඔබ සිත් ගත් සංවාද කොටස උපුටා ගෙන සංවාද ස්වරූපයෙන් කියන්න.
4. මෙම නාට්‍යය පංතියේ රඟ දක්වන්න.

**භාෂා භාවිතය**

1. පහත දැක්වෙන පදවල අර්ථ දක්වන්න.
   i. සංග්‍රහ
   ii. ලජ්ජාව
   iii. විහිළු
   iv. කෙඳිරිය
   v. ආඩම්බර
   vi. සැකය
   vii. දුබල
   viii. දෙඩුම
   ix. අවවාද
2. මෙම වාක්‍යවල හිස් තැනට සුදුසු වචන පාඩමින් තෝරා ලියන්න.
   i. හීන් හාමි මහ මල්හාමිගේ ....................................... පැමිණියේ ය.
   ii. පියාගේ වචනයෙන් පොඩි හාමිනේගේ ....................................මඳක් පිපුණේය.

iii. පොඩි හාමිනේ කුකුළු පියාපතක් හීන් හාමිගේ ...................................... පැළැන්දුවා ය.

iv. හැබෑට ම ...................................... කටින් ද ගෙන එන්නේ.

v. නුවණ හාමි, විහිළු හාමි දෙස රහස් ...................................... හෙළීය.

3. පහත සඳහන් අතීත කාල ඒකවචන ක්‍රියාපද යොදා වාක්‍ය පහක් ලියන්න.

i. කළා ය.

ii. නැවතුණේ ය.

iii. ගියේ ය.

iv. කීවා ය.

v. බැලුවේ ය.

4. මෙම පදවලට විරුද්ධ පද අදාළ කොටුව තුළින් තෝරා ලියන්න.

i. කීකරු ........................................

ii. වේලාව ........................................

iii. ඈත ........................................

iv. පොඩි ........................................

v. බිම ........................................

vi. හොඳ ........................................

vii. බොරුව ........................................

viii. විශ්වාසය ........................................

ix. ආරම්භය ........................................

x. පස්සෙන් ........................................

| |
|---|
| අකීකරු |
| නරක |
| උඩ |
| ඉස්සරහින් |
| ලොකු |
| මෑත |
| අවිශ්වාසය |
| අවේලාව |
| ඇත්ත |
| අවසානය |

5. පහත සඳහන් වාක්‍ය ලේඛන බසට හරවන්න.

උදා : * ඔබ අද මඟුල් ගෙදර කෑම කනවයැ?
* ඔබ අද මඟුල් ගෙදර කෑම කන්නෙහි ද?

i. අපි අද සෙල්ලම් කරනවා

.................................................................................................

ii. මහ මල්හාමි පොඩි හාමිට කිවුවා

.................................................................................................

iii. හීන් හාමිට යාළුවෝ විහිළු කරන්නට පටන් ගත්තා

.................................................................................................

.................................................................................................

iv. මාත් මඟුල් ගෙදර යනවා

.................................................................................................

6. පහත සඳහන් යෙදුම්වලින් කියැවෙන අදහස ඔබේ වචනවලින් ලියන්න.

i. අපට කටයුතු බොහොමයි

ii. බිය අර ඇසේ රළුව දැක්කා ම

iii. කුමකට ද ළමයා බිය ?

iv. දියෙහි තමාගේ පිළිබිඹුව බලා